ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ඉදිකිරීම්වලින් පසුව 2024 මාර්තු 14 දින සිට උපයෝජනය සඳහා ලබාදී තිබුණු ගම්පහ නිල පියස ගොඩනැගිල්ලේ රු.588,332,550ක් වූ ඉදිකිරීම් වියදම ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත නොකර නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි.	2024 වර්ෂය සඳහාද මේ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර වත්කම ඉදිකිරීම අවසන්කර නොතිබූ බැවින් වත්කම් ගිණුමට මාරුකිරීමට හැකියාවක් නොවීම මෙයට හේතුව විය. මේ වන විට මෙම අගය ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව දන්වා සිටිමි.	වත්කමක් භාවිතයට ගැනීමේදී වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය.
(ii)	අමාත්‍යාංශයට අයත් බංගලා නිවාස 13ක හා සමූළ නිවාස 15ක ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ද, බංගලා නිවාස 30ක හා සමූළ නිවාස 65ක ඉඩම් වටිනාකම ද, මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. තවද ස්වදේශ කටයුතු අංශයට පවරාගෙන තිබුණු ආරුගම්බේ සංචාරක බංගලාව හා එහි ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	අමාත්‍යාංශයට අයත් බංගලා නිවාස 32ක ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම මේ වන විට තක්සේරු කර ඇත. ඒවා ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. ආරුගම්බේ සංචාරක බංගලාව හා එහි ඉඩම පවරා ගෙන ඇති නමුත් තක්සේරු වටිනාකම් ලබා ගැනීමට අදාළව ඉදිරි කටයුතු සිදුවෙමින් පවති.	අමාත්‍යාංශය සතු නිල නිවාස පිහිටි ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය.
(iii)	ස්වදේශ කටයුතු අංශය සතුව පවතින වාහන 06ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	මීට අදාලව කමිටුව පත් කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් නිලධාරියෙකු පත් කර එවන ලෙස දැනුම් දී ඇත. එම නාමයෝජනාව ලද පසුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.	වාහන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි.	විගණන නිර්දේශ පරිදි මුදල් රෙගුලාසි සංග්‍රහයේ VI වැනි උපලේඛනය ප්‍රකාරව මෝටර් රථ වාහන ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුය.

(ඇ) විගණන සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.15,717,369,276ක් වූ මූල්‍ය නොවන වත්කම් සඳහා විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	අමාත්‍යාංශයේ 2024 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් සඳහා වන ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කරන බැවින් අවසන් වූ විගස එය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදිය යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ ගොඩනැගිලි හා නිවාස වැනි වත්කම්වලින් උපයන කුලී ආදායම් 20.02.01.01 දරන ආදායම් සංකේතාංකයට බැර කළයුතු වුවද, එසේ කුලී ආදායම් ලබාගන්නා ගොඩනැගිලි හා නිවාස මොනවාද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් පූර්ව හඳුනාගත් දත්ත පද්ධතියක් නොපවතින බැවින් සම්පූර්ණ ගොඩනැගිලි හා නිවාස කුලී නිවැරදිව ගිණුම්ගත කර ඇති බව තහවුරු නොවුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2021 මගින් රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීම පිළිබඳ මාර්ගොපදේශයන් හඳුන්වා දී ඇති අතර එමගින් 20.02.01.01 ආදායම් සංකේතාංකයට අයත් ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු හා ගොඩනැගිලි හා නිවාස කුලී මගින් උපයන ආදායම් උක්ත ආදායම් ශිර්ෂයට බැර කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත වාර්තා වේ.	සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රජයේ ගොඩනැගිලි හා නිවාස පිළිබඳව පූර්ව හඳුනාගත් දත්ත පද්ධතියක් පවත්වා ගැනීම මගින් නිවැරදිව ආදායම් සංකේතාංකයට බැරවන බවට තහවුරු කර ගත යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ගොඩනැගිලි කුලිය රු.346,512,987ක් වූ අතර එය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී රු.59,167,654කින් හෙවත් සියයට 21කින් වැඩිවී තිබීමෙන් හිඟ කුලිය කාලීනව අයකර ගැනීම දුර්වල මට්ටමක පැවැතුණි. මෙම හිඟ කුලී මුදලින් රු.168,499,955ක් 2021 වර්ෂයට පෙර සිට අයවිය යුතුව පැවතුණි. තවද, මෙම හිඟකුලී මුදලින් රු.30,383,153ක් මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන්ද කරනු ලැබේ.	2025 මාර්තු 31 දින දක්වා රු.53,728,880 ක් අයකරගෙන ඇත. එමෙන්ම මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා හා නිල නිවාස වලින් 2025 මාර්තු 31 දින දක්වා රු.5,236,525ක් අයකරගෙන ඇත.	නිවාස කුලී නොපමාව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම හා හිඟකුලී වැඩිවීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගත යුතුය.

(i)	2017-2019 කාල පරිච්ඡේදය තුළ අවස්ථා 122කදී අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය සතු නිවාඩු නිකේතන 07කින් අයවිය යුතුව තිබුණු රු.2,102,450ක ආදායමක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2017-2019 කාල පරිච්ඡේදය තුළ ජනාධිපති ලේකම් කාර්යාලය සහ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නමින් වෙන් කරන ලද නිවාඩු නිකේතනවල නවාතැන් ලබාගත් පුද්ගලයින්ගේ තොරතුරු නිසි ආකාරව සටහන් නොකිරීම මත අයකරගත යුතු පුද්ගලයන් හඳුනාගත නොහැකිව පවතින හිඟ ආදායම් ශේෂයකි. මේ පිළිබඳව තවදුරටත් තොරතුරු පරීක්ෂා කරමින් පවතී.	නිවාඩු නිකේතන පරිහරණය පිළිබඳ විධිමත් වාර්තාකරණයක් පවත්වා ගතයුතු අතර මෙම හිඟ ආදායම් අයකර ගැනීමට නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ii)	2015-2018 කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.1,478,227ක් වූ ශේෂ 19ක් ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිටපු ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් 37 දෙනෙකුගෙන් රු.2,714,701ක හිඟ නිවාස කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි.	හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ඇමතිවරුන්ගෙන් අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට දිගින් දිගටම ලිපි මගින් දැනුවත් කිරීමත් දුරකථන මගින් දැනුවත් කිරීමත් සිදු කරනු ලබන අතර ඒ සඳහා ඔවුන්ගේ ප්‍රතිචාර අවම මට්ටමක පවතී.	හිඟ නිවාස කුලී වැටුපෙන් අයකර ගතහැකි ක්‍රමවේදයක් සැකසීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(iii)	සමුළු නිවාස 27කින් 2012 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළව අයනොවී පවතින හිඟ කුලී රු.2,158,417ක් ද ජයවඩනගම නිවාස 15කින් 2012 සිට 2021 දක්වා කාලයට අදාළව අයනොවී පවතින හිඟ කුලිය රු.8,767,895ක්ද මේ දක්වාම අයකර ගෙන නොතිබුණි.	සමුළු නිවාසවලින් 2025 මාර්තු 31 දින වනවිට රු. 137,286 ක මුදලක් අයකරගෙන ඇත. ඒ අනුව 2012 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල හිඟ මුදල රු.2,064,980 කි. ජයවඩනගම නිවාසවල පදිංචිව සිටි නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ නිවාස කුලී අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගැනීමෙන් අනතුරුව එම හිඟ මුදල් මු.රෙ. අනුව කපාහැරීමට ඇති හැකියාව පිළිබඳව විමසා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	නිලධාරීන් වෙත නිවාස ලබාදීමේ දී කුලී අයකිරීම සම්බන්ධව ලිඛිත එකඟතාවයක් ලබාගත යුතු අතර ඒ අනුව කටයුතු කළ යුතුය.
(iv)	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා නිවාසයකින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.6,837,470ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් අයවීමට ඇති හිඟ නිවාස කුලී මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගනිමින් පවතී.	නිවාස ලබාදීමට අදාළව අදාළ ආයතන සමඟ ලිඛිත ගිවිසුමකට එළැඹීමට කටයුතු කළ යුතුය.

(v)	2009-2016 කාලපරිච්ඡේදය තුළ ජනාධිපති ආරක්ෂක අංශයේ නිලධාරීන් වෙත ලබාදීමට ජනාධිපති කාර්යාලය වෙත ලබාදී තිබූ නිවාස 10කින් අදාළ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් නිවාස කුලී ගෙවීම් සිදු කරන බව දන්වා තිබුණ ද මේ වනතුරු නිවාස කුලී ගෙවා නොමැත.	නිලධාරීන් වෙත නිවාස ලබාදීමේදී කුලී අයකිරීම සම්බන්ධව ලිඛිත එකඟතාවයක් ලබාගත යුතු අතර ඒ අනුව කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලධන හා පුනරාවර්තන වැය විෂයන් 16 ක් සඳහා සලසාගෙන තිබුණු රු.22,900,000ක ප්‍රතිපාදන උපයෝජනය නොකර සම්පූර්ණයෙන් ඉතිරිව පැවතුණි. මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 36ක් සඳහා සලසාගෙන තිබුණු රු.6,647,850,000ක ප්‍රතිපාදනවලින් රු.5,936,220,685ක් එනම් සියයට 89කට වැඩියෙන් අපේක්ෂිත කාර්යයන් සඳහා වැය නොකර ඉතිරිව පැවතුණි.	කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම , ප්‍රමාද වීම, කාර්යයන් අවසන් නොවීම, මැතිවරණයට අදාළ ක්‍රියාකාරකම් හේතුවෙන් පුහුණු වැඩසටහන් සීමා කිරීම, වියදම් පාලනය, අවශ්‍යතාවයන් පැන නොනැගීම, අත්‍යවශ්‍ය වැඩ සඳහා වූ ප්‍රසම්පාදනය පමණක් සිදුකිරීම, රාජ්‍ය අමාත්‍ය ධූර අහෝසි කිරීම, රාජ්‍ය භාෂා අංශය, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට පැවරීම නිසා අවසන් කාර්තුවේදී ප්‍රතිපාදන භාවිතයට නොගැනීම, ජාතික අයවැය චක්‍රලේඛයට අනුව රැස්වීම්, වැඩමුළු, සම්මන්ත්‍රණ, හා පුහුණු සැසි ආදිය හැකි සෑම අවස්ථාවකම මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීම, බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව විසුරුවා හැරීමත් සමඟ එහි කාර්ය මණ්ඩල ස්ථානමාරු ලැබීමත් සමඟම ප්‍රතිපාදන අවශ්‍යතාවය අවම වීම යන හේතු මත ප්‍රතිපාදන ඉතිරි විය.	මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු අතර සලසා ගත් ප්‍රතිපාදන සැලසුම් සහගතව අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට වැය කළ යුතුය.
(ආ)	අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 05කට මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ප්‍රතිපාදනද ඇතුළුව සලසා දී තිබුණු රු.147,500,000ක ප්‍රතිපාදනවලින් රු.114,170,019ක් හෙවත් සියයට 77ක් ද ඉන් ආයතන	ආයතන විසින් තම අරමුදල් භාවිතා කිරීම, අපේක්ෂා කළ පරිදි මූල්‍ය ප්‍රගතියක් ලබා ගැනීමට අපොහොසත් වීම, ප්‍රාග්ධන වියදම් සඳහා අමාත්‍යවරයාගේ එකඟතාවය නොලැබීම හා අක් මුදල් නිදහස් කිරීම සීමා කිරීම, රටෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වය (අධික වර්ෂාව)	මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු අතර සලසා ගත් ප්‍රතිපාදන සැලසුම් සහගතව අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට වැය කළ යුතුය.

	02කට පුනරාවර්තන වැය විෂයයන් 03ක් සඳහා සලසා දී තිබුණු රු.41,000,000ක ප්‍රතිපාදනවලින් රු.34,399,957ක් හෙවත් සියයට 84ක් ද අපේක්ෂිත කාර්යයන් සඳහා වැය නොකර ඉතිරිව පැවතුණි.	නිසා ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම, වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා ආයතනය විසින් තම අරමුදල් භාවිතා කිරීම, වියදම් පාලනය හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය.	
(ඇ)	පුනරාවර්තන හා මූලධන වැය විෂයන් 08ක් සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරුකරගෙන තිබූ එකතුව රු.161,951,376ක ප්‍රතිපාදනවලින් රු.150,421,599ක ප්‍රතිපාදන ද, 2016-2020 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කර තිබුණු පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහනෙහි බැරකම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු බිල්පත් පියවීම සඳහා මාරුකර තිබූ රු.124,383,923ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ද ඉතිරිව තිබුණි.	වර්ෂයේ තෙවන හා අවසන් කාර්තුවලදී අතිකාල සීමා කිරීම, රාජ්‍ය අමාත්‍ය ධූර අහෝසි කිරීම සහ කාර්ය මණ්ඩලය විසුරුවා හැරීම හේතුවෙන් වියදම් ජනනය නොවීම, ඉදිකිරීම් කටයුතු නියමිත කාල සීමාව තුළ අවසන් කිරීමට කොන්ත්‍රාත් කරුවන් අපොහොසත් වීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇණවුමක් ලබා දී ඇතත් ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම, පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහනේ අතැති බිල්පත් පියවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024 දෙසැම්බර් 31 දින ලැබීමෙන් අනතුරුව ප්‍රතිපාදන වෙන් කලද අක් මුදල් ප්‍රමාණවත් නොවීම, වැනි හේතු මත ප්‍රතිපාදන ඉතුරු විය.	ප්‍රතිපාදන මාරු කිරීම සැලසුම් සහගතව සිදුකළ යුතු අතර එම සැලසුම් මත ඒවා වැය කළ යුතුය.
(ඈ)	පුනරාවර්තන හා මූලධන වැය විෂයන් 05ක මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය සියයට 142ත් සියයට 374ත් අතර පරාසයක වන පරිදි එකතුව රු.56,900,000ක් වූ මූලික වියදම් ඇස්තමේන්තුව රු.249,955,725ක් දක්වා රු.193,055,725කින් එනම් සියයට 339කින් වැඩි වී තිබීමෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව සිදුවී නොතිබුණි.	අමතර වියදම් පියවා ගැනීම සඳහා මු.රෙ 66 මාරු කිරීම සිදු කිරීම, වෙන් කළ අයවැය ප්‍රතිපාදන ඒ ආශ්‍රිත වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ මූලික වියදම් ඇස්තමේන්තුව ඉක්මවීම හේතුවෙන් මු.රෙ. 66 මාරු කිරීම් සිදුවිය.	මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ගෙවිය යුතු රු.20,281,657ක් එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණද, අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ බැරකමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දින වන විට පුහුණු වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පැවතිය ද පුහුණු වැඩසටහන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සෑම වියදමක්ම එදිනට නිරවුල් කර ඇත. තවද, එම ආයතනය විසින් 2025 මැයි 09 දින එවා ඇති 2024 නොවැම්බර් 01 – 2025 මාර්තු 31 කාලපරිච්ඡේදයේ වියදම් /මුදල් ලැබීම් පිළිබඳ වාර්තාවෙහි එම ආයතනයට අප අමාත්‍යාංශයේ පුහුණු වැඩසටහන් වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.20,219,918 කි.	ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීම සඳහා වන බැරකම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නිරීක්ෂණය නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**			
XIX පරිච්ඡේදයේ 1.1 හා 2.2 වගන්ති	තනතුරු සඳහා නිවාස ඉදිකර, උපලේඛනගත කළ හැකි අතර 2003 ඔක්තෝබර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අමාත්‍යාංශයේ පාලනය යටතේ යම් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු හෝ නිලධාරීන් වෙනුවෙන් උපලේඛනගත නිවාස නොමැති වුවද අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පොදු නිවාස 06ක් හා	11/2003 චක්‍ර ලේඛය මගින් 2003 වර්ෂයේ පැවති තත්ත්වය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදුකර ඇති අතර ඒ අනුව එම වසර වන විට උපලේඛනගත නිවාස නොතිබූ බව දන්වා ඇත. 2003 වර්ෂයෙන් පසු සේවා අවශ්‍යතාවය සහ සුවිශේෂී වූ හේතු සලකා බලා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලවන අදාළ තනතුරු සඳහා මෙම අමාත්‍යාංශයට අයත් නිල නිවාස	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව තනතුරු සඳහා නිවාස ඉදිකර උපලේඛණගත කළහැකි වුවත් ලබාදී ඇති නිල නිවාස උපලේඛණගත කළ නොහැකිය. එබැවින් ඒ සඳහා

	අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පොදු නිවාස 16ක් උපලේඛනගත කර ලබාදී තිබුණි.	ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 2.2 වගන්තිය ප්‍රකාරව උපලේඛනගත කර ලබා දී ඇත.	විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
මුදල් රෙගුලාසි 104	අලාභ හානිය සිදුවූ දින සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් ස්වදේශ කටයුතු අංශයට අයත් වාහන අනතුරු 07ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරිම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවති.	වාහන අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 හා 2024 වර්ෂයන්හිදී අමාත්‍යාංශයෙන් බාහිර ආයතන 52ක මූලික විමර්ශන 56ක් පැවැත්වීම සඳහා සංවර්ධන නිලධාරීන් 21දෙනෙකු නම්කර යැවීමට විමර්ශන අංශය කටයුතු කර තිබුණු අතර නියැදි පරීක්ෂණ අනුව ආයතන 04ක විමර්ශන 04ක් පැවැත්වීම වෙනුවෙන් සුදුසු දීමනාවක් ගෙවන ලෙස දන්වමින් නම්කර යවා තිබුණු නිලධාරීන් 06දෙනෙකු රු.530,800ක් දීමනා වශයෙන් ලබාගෙන තිබුණි. නිත්‍ය රාජකාරි යටතට නොගැනෙන මූලික විමර්ශනයක් පැවැත්වීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2014 ප්‍රකාරව දීමනාවක් ලැබිය හැකි වුවත් එම චක්‍රලේඛයට හා ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ විධිවිධානවලට පටහැනිව රාජකාරී වේලාව තුළ බාහිර ආයතනවල විමර්ශන පැවැත්වීම	ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රාජ්‍ය ගිණුම් කාරක සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය ව්‍යවසාය කාරක සභාව හා වෙනත් ආයතන වෙතින් ඉදිරිපත් වන මූලික විමර්ශන සඳහා පූර්වගාමී ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර ලබා ගත් එකඟතාවයන්ට අනුව නිලධාරීන් නම් කිරීම සිදු කරනු ලබයි. මූලික විමර්ශනයන් පැවැත්වීමට කුසලතාවයක් ඇති නිලධාරීන් සොයා ගැනීම අපහසු වීමත්, ස්වාධීන බාහිර ආයතනයක් මඟින් එම මූලික විමර්ශන සිදු කරවා ගැනීමට ඇති අවශ්‍යතාවයත් හේතුවෙන් මූලික විමර්ශන සඳහා ඉල්ලීම් ඉදිරිපත් වේ. සමහර ආයතන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2014 චක්‍රලේඛය අනුගත කරගෙන සිටියද බහුතරයක් ආයතන තමන් විසින් පනවා ගන්නා ලද හෝ තීරණය කළ ගාස්තුවක් මූලික විමර්ශන සඳහා ගෙවනු ලබයි. එකී දීමනා තීරණය කිරීම සම්බන්ධයෙන් මැදිහත් වීමේ හැකියාවක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට නොමැත. ඉදිරියේදී ආයතන සංග්‍රහයේ XXX	නිලධාරීන් නම් කිරීමේදී ඔවුන්ට ලබාගත හැකි නීත්‍යානුකූල ගාස්තුව පිළිබඳ දැන්වීම ද සිදුකළ යුතුය. එම ගාස්තුව ගෙවීමට අදාල සේවාලාභී ආයතන දැනුවත් කළ යුතුය.

	වෙනුවෙන් විවිධ චක්‍රලේඛයන්, විවිධ රේටයන් අනුව ගණනය කර සිදුකරන ලද ඉල්ලීම් අනුව දීමනා ලබාගෙන තිබුණි.	පරිච්ඡේදය ප්‍රකාරව රජයට කිසියම් මුදල් ප්‍රතිශතයක් ගෙවිය යුතු ද නැද්ද යන්න පිළිබඳව තීරණය කරන අතර මේ වන විට මෙවැනි ආයතන වෙතින් ඉදිරිපත් වන ඉල්ලීම් සඳහා නිලධාරීන් නම් කිරීම අත්හිටුවා ඇති බවද කාරුණිකව දන්වා සිටිමි.	
(ආ)	අමාත්‍යාංශයට පමණක් සීමා වන පරිදි 2013 දෙසැම්බර් 13 දින ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදී තිබූ අනුමැතිය මත වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ කාර්යය මණ්ඩලයට විශේෂ දීමනාවක් ගෙවා තිබූ අතර එය 2022, 2023 හා 2024 වර්ෂවලදී පිළිවෙලින් රු.358,000ක්, රු.225,000ක් සහ රු.283,500ක් වශයෙන් ගෙවා තිබුණි.	රාජකාරී කටයුතුවලට අමතරව වාර්ෂිකව සිදු කරනු ලබන භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා නිලධාරීන්ට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 දෙසැම්බර් 13 දිනැති අනුමැතිය අනුව ගෙවීම් සිදුකර ඇත.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා දීමනා ගෙවීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. විධිමත් අනුමැතිය රහිත ගෙවීම් නීත්‍යානුකූල නොවන ගෙවීම් ලෙස සලකා කටයුතු කළ යුතුය.
(ඇ)	2022 නොවැම්බර් 28 දින ජනාධිපති කාර්යාලය වෙත පවරා දී තිබුණ ද එහි නීත්‍යානුකූල අයිතිය රාජ්‍ය පරිපාලන අංශය සතු බෙන්ස් වර්ගයේ මෝටර් රථයක් රියදුරු විසින් පෞද්ගලික අවශ්‍යතාවක් සඳහා කොළඹ සිට ගාල්ල දිසාපති කාර්යාලයට යාමේදී 2023 දෙසැම්බර් 19 දින අධිවේගී මාර්ගයේදී අනතුරකට පත්ව තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකර රාජකාරී කටයුතු අතරතුර දී හදිසි අනතුරකට පත් වී ඇති බව සඳහන් කරමින් අමාත්‍යාංශය විසින් මිල ගණන් කැඳවීමකින් තොරව සේවා සැපයුම්කරුවකු තෝරාගෙන රක්ෂණාවරණය මත රු.13,000,000ක් අනතුර සිදුවීමෙන් මාස 09කට පසු අලුත්වැඩියාව සඳහා ගෙවා තිබුණි.	අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අදාළ රක්ෂණ හිමිකම් ලබා ගැනීම සඳහා ඒ වන විට රථයේ ලියාපදිංචි අයිතිකරු හා රක්ෂිත වශයෙන් මෙම අමාත්‍යාංශය මැදිහත් වන ලෙස ජනාධිපති කාර්යාලය විසින් ඉල්ලීම් කරන ලදී. ඒ අනුව අලුත්වැඩියා කටයුතු සිදුකිරීම හා රක්ෂණ හිමිකම් ලබා ගැනීම මෙම අමාත්‍යාංශය විසින් සිදුකරන බවත් තාවකාලික භාවිතය පැවති ජනාධිපති කාර්යාලය විසින් අනතුරට අදාළ මු.රෙ. 104 පරීක්ෂණ සිදුකරන ලෙසත් ජනාධිපති කාර්යාලය වෙත දන්වන ලදී. ජනාධිපති කාර්යාලය විසින් පවත්වන ලද මු.රෙ. 104 පරීක්ෂණයෙහි වාර්තාව මෙතෙක් ලබා දී නොමැත. රථය අලුත්වැඩියා කිරීම සම්බන්ධව කාර්මික ඉංජිනේරු මහතාගේ උපදෙස් සහ නිසි අනුමැතිය ඇතිව මිල ගණන් කැඳවා අඩුම මිල සඳහන් ඇස්තමේන්තුව සඳහා කාර්මික උපදේශක නිර්දේශ සහිතව අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ඉදිරි කටයුතු ජනාධිපති කාර්යාලය වෙත පවරන ලදී	මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා එහි නිර්දේශ මත වැරදිකරුවන්ට එරෙහිව කටයුතු කළ යුතුය. පාඩුවක් සිදුවී ඇත්නම් අදාළ පාර්ශව වෙතින් අයකර ගත යුතුය. වාහනය අලුත්වැඩියා කිරීම ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර සිදුකර වාහනය ධාවනයට එක්කර ගත යුතුය.

3.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අදාල කාර්යය නිම කර දින 10ක් තුළ ලබාගත් අග්‍රිමය පියවිය යුතු වුවත් රාජ්‍ය පරිපාලන අංශය විසින් අවස්ථා 13කදී නිලධාරීන් 12 දෙනෙකු වෙත නිකුත් කර තිබූ රු.883,700ක් ද, ස්වදේශ කටයුතු අංශය විසින් අවස්ථා 14ක දී නිකුත් කර තිබූ රු.457,740ක් ද, වූ අත්තිකාරම් පියවීමට කාර්යය නිම කිරීමෙන් පසු දින 19 - දින 53ත් අතර කාලයක් ගතකර තිබුණි. තවද, රාජ්‍ය පරිපාලන අංශයේ එක් නිලධාරියෙකු ලබාගත් රු.100,000ක් කාර්යය සඳහා වැය නොකර සම්පූර්ණයෙන් ඉතිරිව තිබූ අතර පියවීමට දින 15ක් ගතකර තිබුණි.	මේ වන විට මෙම සියලු කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇති බැවින් කාල ප්‍රමාදයන් වළක්වා ගෙන ඇති බව දන්වා සිටිමි.	අත්තිකාරම් ලබාගැනීමේදී හා පියවීමේදී අක්‍රමිකතා පවතී නම් ඒ සඳහා නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නියැදි පරීක්ෂණ අනුව 1993 සැප්තැම්බර් 21 දිනැති අංක 22/93 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන රාජ්‍ය නිලධාරීන්ට වන්දි ලබා ගැනීම සඳහා වන්දි මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් 2023, 2024 වර්ෂවලදී අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණු වන්දි ඉල්ලුම්පත් 24ක් අතුරින් 11ක් අමාත්‍යාංශයට ලැබුණු දින සිට දින 119- 1297 අතර කාලයක් ගතවී තිබුණ ද වන්දි මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ලබා දී නොතිබුණි. තවත් ඉල්ලුම්පත් 05ක් වන්දි මණ්ඩලයට ඉදිරිපත් කිරීමට දින 60ත් දින 217ත් අතර කාලයක්ද එම ඉල්ලුම්පත්, අමාත්‍යාංශයට ලැබුණු දින	දෛනිකව ලැබෙන වන්දි ලිපි ප්‍රමාණය විශාල වන බැවින් සහ විෂය රාජකාරී ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි නිලධාරීන් නොමැති වීම හේතුවෙන් අදාළ ගොනු පිළිබඳ කටයුතු ඉක්මනින් අවසන් කිරීම සම්බන්ධයෙන් දුෂ්කරතාවයකට මුහුණු දීමට සිදුව ඇත. එසේ වුවද, අදාළ ගොනු සම්බන්ධයෙන් පිළිතුරු නොලද වන්දි ඉල්ලීම් සඳහා සිහි කැඳවීම් ලිපි යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇති බව දන්වා සිටිමි. එසේ යොමු කරන ලද සිහි කැඳවීමේ ලිපි සඳහා මේ වන විටත් පිළිතුරු ලිපි ලැබෙමින් පවතින අතර සම්පූර්ණ කර අවසන් වන්දි ගොනු 45ක් සම්බන්ධයෙන් තීරණ ලබාදීමට	වන්දි තීරණ ප්‍රමාදයකින් තොරව ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

සිට තීරණයක් ලබා දීම සඳහා දින 203-1008ත් අතර කාලයක්ද ගතව තිබුණි. වන්දි ඉල්ලුම්පත් 08කට ලබාදී තිබුණු වන්දි මණ්ඩල තීරණ අදාල පාර්ශව වෙත දැනුම් දීමට තීරණ දිනයේ සිට දින 28 - 42 අතර කාලයක් ගතකර තිබුණි.	නියමිතව ඇත.	

4.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පොළොන්නරුව නිල නිවාස සංකීර්ණය ඉදිකිරීමට අදාළව 2020 වර්ෂයේ රු.125,863,728ක් වැය කර තිබුණ ද ඉදිකිරීමේ ඉදිරි කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබූ අතර වියදම මූල්‍ය නොවන වත්කම්වල නොනිමි වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.	ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2025 සැප්තැම්බර් 08 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. ඒ අනුව නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන ව්‍යාපෘතිය නැවත ආරම්භ කර සියලු ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.	නිවාස සංකීර්ණය ඉදිකිරීම කඩිනමින් ආරම්භ කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගත යුතුය.

4.3 විදේශ ආධාර ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යාපනයේ ඉන්කියුබේටර් (Incubator) සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ විදේශ ප්‍රදාන මගින් රු.50,000,000ක් ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.15,000,000ක්ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද උපයෝජනය කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර වසර 04කට පෙර එළැඹ තිබූ අවබෝධතා ගිවිසුම 2022 පෙබරවාරි 21 දිනෙන් අවසන්ව තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	2024 ඔක්තෝබර් 28 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව 2024 දෙසැම්බර් 12 දිනැතිව භාණ්ඩාගාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සාකච්ඡාවේ දී විෂය පථයට සුදුසු අමාත්‍යාශයක් වෙත මෙම ව්‍යාපෘතිය පවරා දීමට එකඟතාව පළ කර ඇත. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍යාංශයට ද පිටපත් සහිතව අදාළ ප්‍රතිපාදන මූ.රෙ 208 යටතේ සුදුසු අමාත්‍යාංශයක් වෙත පවරාදීමට අදාළ ආයතනවල එකඟතාවය අනුව කටයුතු කරන මෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.	මෙම ව්‍යාපෘතිය සුදුසු අමාත්‍යාංශයක් වෙත පවරා ක්‍රියාත්මක කිරීමට නැවත අවබෝධතා ගිවිසුමකට එළැඹීමේ හැකියාව සලකා බැලිය යුතුය.

(ආ)	මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයයක් යටතේ යුරෝපීය ආයෝජන බැංකු ණය මගින් රු.3,000,000,000ක් හා විදේශ මූල්‍යකරණ යටතේ රු.500,000,000ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේදී විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ වෙන්කරගෙන තිබුණු ප්‍රතිපාදනවලින් රු.18,256,008ක් පමණක් වැය කර තිබුණි. ප්‍රසම්පාදන කටයුතු අවසන් කර කොන්ත්‍රාත් පිරිනැමීම ප්‍රමාදවීම හේතුවෙන් ඉකුත් වර්ෂ දෙක තුළදීද සලසාගෙන තිබූ රු.1,977,034,807ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.	මෙම ව්‍යාපෘතිය යුරෝපා ආයෝජන බැංකුවේ (EIB) ණය මුදල මත ක්‍රියාත්මක කිරීම සැලසුම් කර තිබුණ ද යුරෝපා ආයෝජන බැංකුව වෙතින් අරමුදල් නොලැබීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වී ඇත.	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර විදේශ හා දේශීය අරමුදල් මගින් සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව එක්ව ක්‍රියාත්මක කර තිබූ මහ කොළඹ ජලය සහ අපජලය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන 03 කොටස ක්‍රියාත්මක කිරීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ දේශීය අරමුදල් මගින් සලසාගෙන තිබුණු රු.2,000,000,000ක සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.	2022 දී කොන්ත්‍රාත්කරු විසින් මුදල් නොලැබීම මත කොන්ත්‍රාත්තුව නවතා දමා ඇති අතර එය නැවත එම කොන්ත්‍රාත්කරු මගින් ඉටු කරවා ගැනීමට කැබිනට් අනුමැතියක් ලබා ගෙන ඉදිරි කටයුතු කරමින් පවතී.	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනයේ (JICA) ණය යටතේ රු.2,000,000,000ක් ද පරිපූරක ප්‍රතිපාදන යටතේ ප්‍රතිපූර්ණය කළහැකි විදේශ ණය රු.2,000,000,000ක් ද විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.500,000,000ක් ද වශයෙන් රු.4,500,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද,	2022 ජුනි මාසයේ සිට 2024 අගෝස්තු මාසය දක්වා JICA ආයතනය තම අරමුදල් ලබා දීම අත්හිටුවා තිබීම මත ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පහළ ගොස් තිබුණි. තවද එතෙක් කරන ලද වැඩවලට අදාළව සීමිත බිල්පත් ප්‍රමාණයක් පරීක්ෂා කර ගෙවීම් සිදු කළ බැවින් සීමිත මුදල් ප්‍රමාණයක් පමණක් වැය විය. තවද මෙතෙක් උපදේශන සමාගම් දෙකෙහි උපදේශකවරුන්ගේ බඳවා ගැනීමේ කටයුතු සිදු කර නොමැති බැවින් සිවිල් වැඩ ආරම්භ කිරීමට නොහැකි වී ඇත.	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර විදේශ හා දේශීය අරමුදල් මගින් සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

	රු.1,262,270,284ක් පමණක් වැයකර තිබීමෙන් රු.3,237,729,716ක් එනම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 72ක් ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.		
(ඉ)	ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා එක්සත් රාජධානියේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.200,000,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිව තිබුණි. ඉකුත් වර්ෂයේදී ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සලසාගෙන තිබුණු රු.200,000,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.	2024 වර්ෂයේ සලසා ගත් රු.200,000,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වුයේ කොන්ත්‍රාත්කරුගේ රඳවුම් මුදල් නිදහස් නොකිරීම හේතුවෙනි. කොන්ත්‍රාත්කරු තුන්වන පාර්ශවයක් සමඟ ගිවිසුම්ගත වී ඇති බැවින් රඳවුම් මුදල් නිදහස් කිරීමට නීති උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර එයින් ලබා දෙන තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර විදේශ අරමුදල් මගින් සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය.

4.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් පාලන ආයතන හරහා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සලසා දී තිබූ රු.150,000,000ක ප්‍රතිපාදනවලින් රු.125,766,145ක් හෙවත් සියයට 84ක් ඉතිරිව තිබුණි. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සහා අරමුදල් භාවිතයෙන් ව්‍යාපෘති සිදුකර තිබීමත්, අනෙකුත් පළාත් පාලන ආයතනවල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.	වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව 2021 වර්ෂයේ අනුමත කරන ලද අර්ධ වශයෙන් නිම කර තිබුණු කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ කටයුතු සඳහා එම සභා අරමුදලෙන් දරා ඇති වියදම රු.32,629,754 වේ. ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතිවල වියදම ඇස්තමේන්තුගත මුදලට වඩා අඩු වී ඇත. කොලොන්න ප්‍රාදේශීය සභාවේ නොදිරන ගබඩා මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතියෙහි කටයුතු සඳහා නියමිත කාලසීමාව තුළ සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු සොයා ගැනීමට අපහසු වීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි කටයුතු කිරීමේ දී ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම ආදී කරුණු මත ප්‍රතිපාදන ඉතිරි විය.	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ සංවර්ධන වැඩසටහන සඳහා සලසාගෙන තිබුණු රු.600,000,000ක ප්‍රතිපාදනයෙන් රු.390,444,692ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණු අතර ඉන්	වර්ෂය අවසානයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය නිසා ඉදිකිරීමේ කටයුතු නිම කිරීමට නොහැකි වීමත් මහා පරිමාණ ඉදි කිරීම් සඳහා කාලය ප්‍රමාණවත් නොවීමත් හේතුවෙන් 2024 වර්ෂය සඳහා	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර සලසාගත් ප්‍රතිපාදන

	රු.79,039,683ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරුකර වැයකර තිබුණි.	වෙන් වු ප්‍රතිපාදන ඉතිරි විය.	සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	"ඊ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සලසාගෙන තිබුණු රු.1,150,000,000ක් වූ ප්‍රතිපාදනවලින් ඉතිරිව තිබුණු සියයට 90ක එනම්, රු.1,032,579,107ක ප්‍රතිපාදනවලින් රු.124,383,923ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර වැයකර තිබුණි. ව්‍යාපෘතියේ නියමු අදියර යටතේ රු.59,940,000ක් වැය කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක සිදුකළ ව්‍යාපෘතීන් සම්පූර්ණයෙන් අක්‍රිය වී ඇති අතර එහි දෙවන අදියර ලෙස දිස්ත්‍රික්ක 07ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 95ක ආරම්භ කර ඇති ව්‍යාපෘති සඳහා 2024 වර්ෂය වන විට රු.355,436,458ක් වැය කර තිබුණද අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට අපොහොසත් වී තිබුණි.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරී වෙත 2 in 1 පරිගණක යන්ත්‍ර ලබා දීම සඳහා සහ මෘදුකාංග වැඩි දියුණුවට අදාළ පළමු ගෙවීමේ සිට සිදුවූ ගෙවීම් ප්‍රමාදයන් සහ ගිවිසුම්ගත කාල රාමුව අනුව සිදු කළ යුතු කාර්යයන්ට අදාළ තහවුරුකර ගැනීම්වල ප්‍රමාදයන් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලත් දිස්ත්‍රික්ක 07 සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද නමුත් ප්‍රතිපත්තිමය තීරණ මත හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණ පරිදි ව්‍යාපෘතිය කළුතර දිස්ත්‍රික්කයෙහි පළමුව ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය මත ඉතිරි දිස්ත්‍රික්කවල ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමට තීරණය විය.	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	පළාත් පාලන ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සලසාගෙන තිබුණු රු.1,000,000,000ක මූලධන ප්‍රතිපාදනවලින් රු.150,000,000ක ප්‍රතිපාදන වෙනත් මූලධන වැය විෂයයකට මාරුකර තිබුණු අතර, රු.396,893,978ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. ඒ අනුව, සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 55කට වැඩියෙන් අරමුණුගත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය යටතේ රු.685,200,000 කට අදාළ උප ව්‍යාපෘති අනුමත කර පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සැලසුම් කර තිබුණි. එහෙත් 2024 ජූලි 26 දින ප්‍රකාශයට පත් කරන ලද ජනාධිපතිවරණය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාධා ඇති වීමත් ප්‍රසම්පාදනය සඳහා ප්‍රමාණවත් කාලයක් ඉතිරිව නොමැති වීම සහ අවසන් මාස පහ තුළ පැවති අධික වර්ෂාපතනය ව්‍යාපෘති ප්‍රමාද කරවීමට හේතු විය.	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඉ)	අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රජයේ ආයතන සතු නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා, සංචාරක කර්මාන්තයටද යොදාගත හැකි වන පරිදි ප්‍රයෝජනයට ගැනීම සඳහා සලසාගෙන තිබුණු රු.600,000,000ක ප්‍රතිපාදනවලින් අමාත්‍යාංශය යටතේ පවතින සංචාරක බංගලා 12ක් සංවර්ධනය කිරීම සඳහා වෙන්කර	මෙම ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් සැපයූ ඍජු ප්‍රතිපාදනයක් වන අතර මූලික සැලසුම් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර කොන්ත්‍රාත් පිරිනැමීම වර්ෂයේ අවසාන භාගයේ සිදුවීමත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂයේ මාස 04 ක් වැනි සීමිත කාලයක් පැවතීම, එම කාලය තුළ ද මැතිවරණ කාර්යයන්වල රජයේ නිලධාරීන්ට නිරත	ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලමින් ප්‍රතිපාදන සලසා ගතයුතු අතර සලසාගත් ප්‍රතිපාදන සැලැසුම්ගත කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

තිබුණු රු.330,152,110ක ප්‍රතිපාදනවලින් රු.4,550,679ක් ද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා 09ක් සංවර්ධනය කිරීම සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.64,282,884ක් ද පමණක් වැයකර තිබීමෙන් සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 89ක් වූ රු.531,166,437ක් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි.	වීමට සිදුවීම මෙන්ම වැසි සහිත කාලගුණික තත්වය හේතුවෙන් 2024 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය නිමකිරීමට නොහැකි වී ඇත.	
(ඊ) **පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිවල ප්‍රගතිය**		
(i) **පුලතිසි අධ්‍යාපන විද්‍යා පීඨයේ ගුරු නේවාසිකාගාරය** රු.75,330,000ක වියදමින් ඉදිකළ කාමර 72කින් සමන්විත පිරිමි ගුරුවරුන් සඳහා වන තෙමහල් නේවාසික ගොඩනැගිල්ලේ කාමර 44ක් ම නේවාසිකයින් නොමැතිව 2019 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.	මේ වනවිට පිරිමි ගුරුවරුන් 31 දෙනෙක් අධ්‍යාපනය ලැබීමට මෙහි නතර වී ඇති අතර කාමර 41ක් හිස්ව පවතී. ඉදිරි සැලසුම් අනුව මෙම විද්‍යාපීඨය යෝජිත ගුරු අධ්‍යාපන විශ්ව විද්‍යාලයක් බවට පත්වීමේදී මෙම ගොඩනැගිල්ල ප්‍රශස්ථ උපයෝජනයට ගැනීමට හැකියාව ඇත.	ඉදිකරන ලද ගොඩනැගිල්ල ප්‍රශස්ථ මට්ටමින් අරමුණුගත කාර්ය සඳහා උපයෝජනය කළ යුතුය.
(ii) **අත්තනකඩවල මහා විද්‍යාලයේ ශ්‍රවනාගාරය ඉදිකිරීම** 2019 වර්ෂයේදී රු.18,200,000ක් වූ ඇස්තමේන්තු වටිනාකමක් යටතේ රු.27,050,000ක වියදමක් දරමින් ශ්‍රවනාගාරය ඉදිකර වැඩ අවසන් කර තිබුණද, 2024 වර්ෂය අවසන් වන විටත් ශ්‍රවනාගාරයක් ලෙස භාවිතයට ගෙන නොතිබුණි.	ශ්‍රවණාගාරය සම්පූර්ණ වීමට තිරරෙදි, ශබ්ද විකාශණ පද්ධතිය, වේදිකා ආලෝක පද්ධතිය හා අනෙකුත් උපකරණ අවශ්‍යතාවක් ඇති අතර තිබෙන තත්වය මත මේවන විට භාවිතයට ගනු ලබයි.	අනෙකුත් උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කරගෙන ශ්‍රවනාගාරය කඩිනමින් භාවිතයට ගත යුතුය.
(iii) **පහල ඇල්ලේවැව මෙත්කුසුම්ගම ගම්මානය සඳහා ජල ටැංකියක් ඉදිකිරීම** 2018 වර්ෂයේ රු.2,320,196ක් වූ ඇස්තමේන්තු වටිනාකමක් යටතේ මෙත්කුසුම්ගම ගම්මානය සඳහා ලීටර්	මෙම ජල ටැංකිය ඉදිකර වසර කීපයක් ගතව ඇති බැවින් දැනට ඉදිකර ඇති කොටසේ කොන්ක්‍රීට් තත්වය පිළිබඳ පරීක්ෂා කර වාර්තාවක් ලබාදෙන ලෙස දිස්ත්‍රික් ඉංජිනේරු වෙත දන්වා යවා ඇත. මේ වන විට අදාල ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොමැති බැවින්, ප්‍රතිපාදන ප්‍රභවයක් සලසාගත් විගස අදාල	ආරම්භ කර ඇති කාර්යයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රතිපාදන ලබාගෙන අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.

40,000 ක ජල ටැංකියක් ඉදිකිරීමට රු.866,848ක් වැයකර කොන්ක්‍රීට් කණු පමණක් ඉදිකිරීමෙන් පසුව ඉදිකිරීමේ කටයුතු අතරමග නතර වී තිබුණි.	කටයුතු ඵලදායි ලෙස නිම කිරීමට කටයුතු කරනු ලැබේ.	
(iv) **කඳුරුවෙල දුම්රිය නිල නිවාස සහ වානිජ කටයුතු වෙනුවෙන් ඉදිකළ ගොඩනැගිල්ල** ඉදිකිරීම් අවසන් කරන ලද දුම්රිය නිල නිවාසයට යාබදව වානිජ කාර්යයන් සඳහා යොදාගැනීමට ඉදිකර තිබූ දෙමහල් ගොඩනැගිල්ල 2021 වර්ෂයේ සිට කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. භාවිතා නොකිරීම නිසා විදුලි සෝපානය ද ක්‍රියාවිරහිත වී තිබූ අතර ගොඩනැගිල්ල සඳහා යොදවා තිබූ මුරකරුවන් දෙදෙනා සඳහා ගෙවන ලද වැටුප් ද නිෂ්කාර්යවී තිබුණි.	මෙම වාණිජ ගොඩනැගිල්ල 2023 දෙසැම්බර් 30 දින නාගරික සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. එම ගොඩනැගිල්ල සඳහා සූර්ය විදුලි පද්ධතියක් ද සකස්කර ඇති අතර එය 2024 ඔක්තෝබර් 24 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.මින් ඉදිරියට එහි කළමණාකරණයට අදාල තීරණ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබේ.	නිෂ්කාර්යව පවතින ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයන් සඳහා භාවිතයට ගැනීමට දුම්රිය දෙපාර්තමේන්තුව හරහා කටයුතු කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2024 සැප්තැම්බර් 27 දිනට අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශයේ භාවිතයේ නොතිබුණු සහ පොත්පත්, ලේඛන හා ලිපිගොනු තුළින් තොරතුරු සනාථ කර ගැනීමට නොහැකි වූ වාහන 80ක් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණි. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව ඉන් වාහන 50ක් ඒවා භාවිතයට ගනු ලබන ආයතන වෙත විධිමත් පරිදි පවරා දීමට කටයුතු කර නොතිබුණු අතර ඉතිරි වාහන 30 සම්බන්ධව තොරතුරු නොතිබුණි.	වර්තමානය වන විට අමාත්‍යාංශය භාවිතා නොකරන එහෙත් ලියාපදිංචියේ පවතින වාහන 80 ක් අතුරින් 61 ක් පිළිබඳ තොරතුරු තහවුරු කරගෙන ඇති අතර ඉතිරි වාහන වල අයිතිය තහවුරු කරගැනීම සඳහා පළාත් සභා අංශය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් ලිඛිතව තොරතුරු විමසා ඇත.	වෙනත් ආයතන වෙත භාරදුන් වාහනවල අයිතිය පවරාදිය යුතුය.
(ආ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 76ක ලියාපදිංචි සහතික අමාත්‍යාංශය භාරයේ නොතිබුණු අතර ඉන් වාහන	වාහන 27 ක් අතුරින් වාහන 8 ක තොරතුරු මේ වන විට හඳුනා ගැනීමට කටයුතු කර ඇත. හඳුනා නොගත් ඉතිරි වාහන 19 සම්බන්ධව මේ වන විට තොරතුරු සොයමින් පවතී.	වෙනත් ආයතන සතු වාහන භාවිතයේදී එම වාහන පවරාදීමට හා පවරා ගැනීමට කටයුතු

	27ක් සම්බන්ධව තොරතුරු නොතිබුණි. තවද, ලියාපදිංචි වාහන 44ක් පළාත් පාලන ආයතන වෙත භාරදී ඇති බව ලේඛනවල සඳහන් වුවද, වාහන 18ක පමණක් පවරා දුන් දිනය සහ විස්තර පැවතුණි. තවත් වාහන 02ක් යුද්ධයේදී විනාශ වී ඇති බව දක්වා තිබුණද සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු නොතිබුණි. මීට අමතරව ස්වදේශ කටයුතු අංශය වෙනත් දෙපාර්තමේන්තුවලට අයත් වාහන හතරක් භාවිතා කරමින් තිබුණද ඒවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනෙකුත් වාහන ලබා දී ඇති ආයතන පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුවන අතර ඒ වාහන සම්බන්ධයෙන් ලියාපදිංචි සහතික අස්ථාන ගත වීම, වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා නොගැනීම ආදී කරුණු මත පවරා ගැනීම් කටයුතු ප්‍රමාද වී ඇත. වාහන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.	කළ යුතුය.
(ඇ)	2010 වසරේදී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට රැගෙන එන ලද ජනාධිපති ලේකම් කාර්යාලය නමින් ලියාපදිංචි වෙඩි නොවදින රථයක් අලුත්වැඩියාව සඳහා 2014 වර්ෂයේදී නියෝජිත ආයතනය වෙත භාර දී තිබුණි. අලුත්වැඩියාව සඳහා වූ රු.3,237,079ක බිල්පත ගෙවා රථය නිදහස් කර ගන්නා ලෙස දැනුවත් කර තිබුණද ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් රථය භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් නියෝජිත ආයතනයට අයත් ඉඩමක ගාල් කර තිබුණි.	KB -9228 අංක දරණ වෙඩි නොවදින වාහනය එවකට සිටි අමාත්‍යවරයාගේ සහ ලේකම්වරයාගේ උපදෙස් හා අනුමැතීන් අනුව ඒජන්ත ආයතනයට යොමුකර ඇස්තමේන්තු ලබාගෙන ඉදිරි කටයුතු කර ඇත. අලුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට ජනාධිපති කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇත. ජනාධිපති කාර්යාලයේ උපදෙස් ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිත වේ	ජනාධිපති කාර්යාලයේ උපදෙස් ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඈ)	රාජ්‍ය පරිපාලන අංශය සතු නිවාඩු නිකේතන 07ක හා ස්වදේශ කටයුතු අංශය සතු සංචාරක බංගලා 35ක ඉඩම් අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	ඉඩම් පවරා ගැනීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව දන්වා සිටිමි.	අදාළ ඉඩම් පවරා ගැනීමට නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඉ)	නිලමැදුර ගොඩනැගිල්ලේ පිටතින් සවිකර ඇති Cladding සහ වීදුරු පිරිසිදු කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ රු.31,050,000ක් වටිනා ගොන්ඩෝලා යන්ත්‍ර 02ක් මිලදීගෙන තිබුණද, වර්තමානය වන විටත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි.	Dimo ආයතනය මගින් 21 වන මහලෙහි ස්ථාපිත ගොන්ඩෝලා යන්ත්‍රය අළුත්වැඩියා කරමින් පවතින අතර 20වන මහලේ ස්ථාපිත කර ඇති අළුත්වැඩියා කරන ලද යන්ත්‍රය නිසි ක්‍රියාකාරීත්වයේ පවතින බවට රජයේ බලයලත් පරීක්ෂක ඉංජිනේරුවරයෙකුගේ සහතිකයක් ලබාගෙන ඇත.	මිලදී ගත් යන්ත්‍ර අවශ්‍යතාවය සඳහා උපයෝජනය කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 247 ඡේදයේ සඳහන් අරමුණු ඉටුවන ආකාරයෙන් ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවල නිලධාරින්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කර නොතිබුණු අතර අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් නිලධාරින් සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.		
(i) එකම සේවා ස්ථානයක වසර 06කට වැඩි සේවා කාලයක් සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගෙන් ස්ථානමාරුවීම් සඳහා අයදුම්පත් යොමුකර තිබුණේ පිළිවෙලින් නිලධාරීන් 222ක්, 275ක් හා 75ක් පමණක් වන අතර ස්ථාන මාරු කිරීම් සිදුකර තිබුණේ නිලධාරීන් 80ක්, 91ක් හා 32ක් පමණි.	වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම් කළ ද, අනුප්‍රාප්තික නිලධාරියෙකු ලබා දීමට නොහැකි විට, වර්තමාන සේවා ස්ථානයේ නියමිත සේවා කාලය (අවම වසර 03ක) සපුරා නොමැති වීම, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද තනතුරක සේවය කරන විට ස්ථාන මාරුවීම් ගැළපීම් කිරීමට ස්ථාන මාරු මණ්ඩලයට නොහැකි වීම හේතු වී ඇත. වාර්ෂික ස්ථානමාරු වීම්වලදී වුවද නිලධරයන්ගේ ඉල්ලීම් මත පමණක් පදනම්ව ස්ථාන මාරු කිරීමේ හැකියාවක් නොමැති බව දන්වා සිටිමි.	කාර්යපටිපාටික රීතිවල සඳහන් අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි හා දීර්ඝ කාලයක් එකම රාජකාරී ස්ථානයක රැඳී සිටීමට ඇති ඉඩකඩ අහුරමින් ස්ථානමාරු ක්‍රියාත්මක කළ යුතු ය.
(ii) 2024 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක එකම සේවා ස්ථානයක වසර 05කට වැඩි කාලයක් සේවයේ යෙදී සිටි නිලධාරින් 45,966කින් නිලධාරීන් 16,531ක්, 2025 වර්ෂයේ දී ස්ථානමාරු සඳහා අයදුම්කර තිබුණද, ඉන් 5,069ක් සඳහා පමණක් ස්ථානමාරු නියෝග ලබාදී තිබුණි. තවද, අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටින ඒකාබද්ධ	සේවාවන් 07 කින් යුතු ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර එක් එක් සේවා වලට අදාල නිලධාරීන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන්ද වෙන් වෙන් අවධානය යොමු කරමින් මෙම ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. සියලුම වසර පහට වැඩි නිලධාරීන් ස්ථාන මාරු කිරීම ප්‍රායෝගිකව දුෂ්කර බව නිරීක්ෂණය කරමි. මෙහිදී අවධානයට ගත යුතු කරුණක් වනුයේ රාජ්‍ය සේවයේ විශේෂයෙන් PL සිට MN-4 දක්වා වූ වැටුප් කාණ්ඩ හිමි නිලධාරීන් බහුතරයක් ඒකාබද්ධ සේවාවන් යටතට වැටෙන අතර	කාර්යපටිපාටික රීතිවල සඳහන් අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි හා දීර්ඝ කාලයක් එකම රාජකාරී ස්ථානයක රැඳී සිටීමට ඇති ඉඩකඩ අහුරමින් ස්ථානමාරු ක්‍රියාත්මක කළ යුතු ය.

	සේවා නිලධාරීන් 157 දෙනෙකු වසර 05-10ත් අතර කාලයක්ද, තවත් නිලධාරීන් 44දෙනෙකු වසර 10-31ත් අතර කාලයක්ද ස්ථාන මාරු නොලබා අඛණ්ඩව සේවයේ යෙදී සිටිති.	ඔවුන්ගේ රාජකාරී විෂය පථයන් මෙන්ම එම නිලධාරීන් සේවා ස්ථාන වෙත ළඟාවන ප්‍රවාහන පහසුකම් ද ඔවුන් සේවා ස්ථානයක ස්ථානගත කිරීමේදී හැකි සෑම විටම සැලකිල්ලට ගැනීමට සිදුවීමයි.	
(ආ)	ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක නිලධාරීන්ගේ පත්වීම්, උසස්කිරීම් සහ මාරුකිරීම් පිළිබඳ බලධාරියා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වුවද 2024 දෙසැම්බර් 31 දිනට සිටි 130,989ක නිලධාරීන් පුහුණු කිරීම සම්බන්ධයෙන් සැලසුම් සහගත විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය සේවා පුහුණු ආයතනය වසා දැමීමෙන් පසු එම කාර්ය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැවරී තිබුණද අමාත්‍යාංශය හෝ එම ආයතනය මෙම නිලධාරීන් පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ කාර්යය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පවරා දී තිබූ නමුත් එම ආයතනයේ මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් එම කාර්යය නිසියාකාරව සිදුවී නොමැත. මේ වන විට රාජ්‍ය සේවා පුහුණු ආයතනය නැවත ස්ථාපනය කිරීම සඳහා සකස් කළ යෝජනාවට විධිමත් අනුමැතිය ලද පසු එම ආයතනය නැවත ස්ථාපනය කර ඒ හරහා මාණ්ඩලික නොවන සියලුම ඒකාබද්ධ සේවා නිලධාරීන් සඳහා කරගෙන යනු ලබන පුහුණු වැඩසටහන් තවදුරටත් පුළුල් පරාසයක් තුළ සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම සඳහා එමගින් හැකියාව ලැබෙනු ඇත.	ඒකාබද්ධ සේවයට අයත් සියළුම සේවාවල නිලධාරීන් විධිමත් සැලසුමකට අනුව පුහුණු කළ යුතුය.
(ඇ)	බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ 2008 වර්ෂයේ ලියාපදිංචි කරන ලද රාජ්‍ය සේවකයින් හා විශ්‍රාමික රාජ්‍ය සේවකයින් සාමාජිකත්වය දරන සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය, අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබයි. එහි ව්‍යවස්ථාවට අනුකූලව අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බලතල හා රාජ්‍ය සේවකයින් සම්බන්ධයෙන් අමාත්‍යාංශය සතු වගකීම් ප්‍රකාරව රාජ්‍ය පරිපාලන නීතිරීතිවලට සංගමය අවනත විය යුතු වුවද වර්තමානයේදී මෙම ක්‍රීඩා සංගමය අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරව ක්‍රියාත්මකව පවතී. 2009 වර්ෂයේ අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණු පොල්හේන්ගොඩ පිහිටි හෙක්ටයාර 0.2437ක් වූ ඉඩම පවරාදීමේ කොන්දේසිවලට පටහැනිව 2010	2018 වර්ෂයේ දී මෙම අමාත්‍යාංශයට අයත් පොල්හේන්ගොඩ පිහිටි හෙක්ටයාර් 0.2437ක ඉඩම සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය පවත්වාගෙන යාම සඳහා නිසි අනුමැතියකින් ලබා දී ඇත. සංගමයේ පවතින මතභේදාත්මක තත්ත්වයන් පිළිබඳ මේ වන විට අමාත්‍යාංශය වෙත වාර්තා වී ඇත. මෙම ගැටලුව පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා කමිටු විසින් යෝජනා කරන ලද ආයතන වෙත ලිපි යොමු කර ඇත. එම තොරතුරු ලද පසුව කමිටුව නැවත රැස්වීමට නියමිත අතර එහිදී කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා හා කමිටු තීරණ අනුව කටයුතු කිරීමට නියමිත වේ.	ක්‍රීඩා සංගමය පිහිටි අමාත්‍යාංශය සතු ඉඩම හා ගොඩනැගිලි වල අයිතිය පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කර ගතයුතු අතර ක්‍රීඩා සංගමයේ අරමුණු ඉටුකර ගැනීමට අමාත්‍යාංශය මැදිහත් වී ක්‍රියාකළ යුතුය.

	වර්ෂයේදී ක්‍රීඩා සංගමයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා ලිඛිතව භාර දී තිබුණි. භාරදී වසර 14කට අධික කාලයක් ගත වී තිබුණ ද ඉඩම හා ගොඩනැගිලිවල අයිතිය, පැවැත්ම හා ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම, ඉඩම තක්සේරු කර ගිණුම් ගත නොකිරීම හා යාබද පදිංචිකරුවන්ගේ අනවසර අත්පත් කරගැනීම් ද නිරීක්ෂණය විය.		
(ඇ)	පොලිස් නිලධාරීන් නිරෝධායනය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා කාමර 24කින් යුත් අමාත්‍යාංශය සතු යාපනය නිවාඩු නිකේතනය යාපනය පොලිස් අධිකාරීවරයාගේ ඉල්ලීමකට අනුව කිසිඳු නෛතික එකඟතාවයකින් තොරව 2020 වර්ෂයේදී වසරක කාලයක් සඳහා ලබා දී තිබුණි. භාර දී මාස 05කට පසු නිවාඩු නිකේතනයට සිදුවී තිබුණු අලාභහානි හේතුවෙන් සියළු අලුත්වැඩියාවන් සිදුකර යථා තත්ත්වයට පත්කර නැවත භාර දෙන ලෙස අවස්ථා ගණනාවකදී අමාත්‍යාංශය විසින් යාපනය පොලිස් අධිකාරීවරයාව, පොලිස්පතිවරයාව සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාව දැනුවත් කර තිබුණද, නිවාඩු නිකේතනය අලුත්වැඩියා කර දී නොතිබුණි. අලාභහානියෙන් වසර 1½ කට සහ වසර 03කට පසු අලුත්වැඩියාවට පිළිවෙලින් රු.1,738,000ක් හා රු.8,775,000ක් වැය වන බවට තක්සේරු කිරීම පමණක් සිදුකර තිබුණි. මෙම නිවාඩු නිකේතනයෙන් 2016-2019 කාලපරිච්ඡේදය තුළදී රු.11,734,000ක ආදායමක් උපයා තිබුණද ඉන්පසු සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 04කට අධික කාලයක් තුළ කිසිඳු ආදායමක් උපයා ගැනීමට නොහැකි වී තිබුණි. එසේ වුවද සේවක වැටුප්, ජල ගාස්තු හා විදුලි ගාස්තු ගෙවීම සඳහා පමණක් රු. 7,931,039ක් වැයකර තිබුණි.	2023 නොවැම්බර් 14 දිනැති අංක 23/විවිධ දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රජයේ ආයතන සතු නිවාඩු නිකේතන හා බංගලා උපරිම ඵලදායි අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා රු. 600,000,000 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ බැවින්, එම ප්‍රතිපාදන යටතේ යාපනය නිවාඩු නිකේතනයෙහි අලුත්වැඩියා හා සංවර්ධනය කිරීමට 2024 වසරේදී අනුමැතිය ලබාගත් අතර ඒ සඳහා උතුරු පළාත් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු කැඳවන ලදි. අවසාන වශයෙන් සංශෝධනය කළ ඇස්තමේන්තුව මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇත්තේ 2024 අගෝස්තු 20 දිනය. එම ඇස්තමේන්තුවට අදාළව රු.40,000,000ක ප්‍රතිපාදන වෙන්කර ගෙන ප්‍රසම්පාදන කටයුතු සිදුකළ ද අලුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත්කරුවකු ඉදිරිපත් නොවීමත්, ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවතීමත් හේතුවෙන් මේ කටයුත්ත වෙනුවෙන් අදාළ ආයතනවලින් ලද සහාය ද ඉතා අඩු මට්ටමක පැවතීමෙන් මෙම අලුත්වැඩියාවන් කර ගැනිමට නොහැකි විය.	නොපමාව නිවාඩු නිකේතනය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට ක්‍රියාකළ යුතුය.

	අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රජයේ ආයතන සතු නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා උපරිම ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගැනීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා රු.40,000,000ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, ඒවා උපයෝජනය කර නොතිබුණි.		
(ඉ)	පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ අනුමත උපරිම පෞද්ගලික කාර්යය මණ්ඩල නිලධාරීන් සංඛ්‍යාව 06ක් වන පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනෙකු සඳහා සිටි පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 1231ක් සඳහා වැටුප් ගෙවීමට වැයකර තිබුණු රු.508,015,904කින් රු.11,741,387ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 85 දෙනෙකුගේ පෞද්ගලික කාර්යය මණ්ඩල නිළධාරීන් 142 දෙනෙකුට පත්වීම් දිනය හා වැඩ භාරගත් දිනය අතර කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් ගෙවීමට වැය කර තිබුණි. මෙම නිලධාරීන් වැටුප් ලබාගත්තද, ඒ බවට මු.රෙ. 238(5) ප්‍රකාරව වැටුප් ලේඛනවල අත්සන් කර නොතිබුණ ද දිගින් දිගටම ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් වෙත වැටුප් ගෙවා තිබුණි.	මු.රෙ. 238(5) ප්‍රකාරව වැටුප් ලේඛන අත්සන් නොකිරීම සම්බන්ධව එවකට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්ගේ උපදෙස් මත පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්යමණ්ඩලය පත්කිරීමත් පත්කිරීම් අවසන් කිරීම් හා සම්බන්ධ වන කාර්ය පටිපාටියක් සකස් කර ඇති අතර මින් ඉදිරියට මෙවැනි අතපසුවීම් සිදු නොවීමට පියවර ගෙන ඇත.	පත්වීම් දින හා වැඩ භාරගත් දින අතර කාලයට සිදුකළ ගෙවීම් අයකර ගත යුතුය.
(ඊ)	1970 වසරේ සිට 2010 වසර දක්වා අමාත්‍යාංශය නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1324ක් ද 1979-2014 කාලපරිච්ඡේදය තුළදී අවලංගු කර තිබුණු චක්‍රලේඛ 19ක් ද අමාත්‍යාංශ වෙබ් අඩවියේ පවතින අතර එම චක්‍රලේඛ යාවත්කාලීන කර චක්‍රලේඛවල වලංගුභාවය සම්බන්ධයෙන් පරිශීලකයින්ට පවතින ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	1970 වර්ෂයේ සිට 1988 වර්ෂය දක්වා වන චක්‍රලේඛ එකිනෙක පරීක්ෂා කරමින් අවලංගු කර ඇති සහ සංශෝධන කර ඇති චක්‍රලේඛ හඳුනා ගැනීමට කටයුතු කර ඇති අතර, එසේ හඳුනාගත් චක්‍රලේඛ සඳහා මෘදුකාංගයක් අධාරයෙන් සබැඳියන් ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. එම කටයුත්ත අවසන් වූ වහාම අදාළ චක්‍රලේඛ අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි උඩුගත කිරීම සඳහා තොරතුරු අංශය වෙත බාරදීමට සැලසුම් කර ඇත.	අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පවතින චක්‍රලේඛ යාවත්කාලීන කර පවත්වා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තියට අනුව, වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් සිදුකළ යුතු අවස්ථාවක තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. එසේ වුවද පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා සහ සේවයට නොපැමිණෙන නිලධාරීන්ගේ කාර්යයන් ඉටුකිරීම සඳහා වැඩ බැලීමේ පදනම මත 2023-2024 වර්ෂවලදී පත්කර තිබූ විධායක ශ්‍රේණියේ නිලධාරීන් 19දෙනෙකුට හා කළමනාකරණ සේවයේ නිලධාරීන් 46දෙනෙකුට වැඩ බැලීමේ දීමනා වශයෙන් රු.4,748,892ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන් තනතුරු දෙකෙහිම සම්පූර්ණ රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර තිබුණි.	අදාළ කාල සීමාව තුළදී ඇතැම් තනතුරු සඳහා නවක බඳවා ගැනීම් සිදු නොකිරීමත්, එම තනතුරුවල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම්, විශ්‍රාම යාම් ආදී කරුණු හේතුවෙන් ඇති වූ පුරප්පාඩු හේතුවෙන් අදාළ අංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම් හා නිර්දේශ මත පදනම්ව පත්වීම් බලධාරියාගේ විධිමත් අනුමැතිය මත, වැඩ බැලීම සඳහා නිලධාරීන් පත්කිරීම සිදුකර ඇත.	තාවකාලික පුරප්පාඩු සඳහා වැඩ බැලීම් පත්වීම් ලබාදීම නැවැත්විය යුතුය.